*සැ. යු.* - 2024.03.07 දින පළ කරන ලද අංක 2375 *ගැසට්* පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,376 - 2024 මාර්තු මස 15 වැනි සිකුරාදා - 2024.03.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 788 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 800 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 801 |

*සැ. යු.* - කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත, 2024 මාර්තු මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට්* පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට්* පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 අප්‍රේල් මස 05 වැනි දින පළ කෙරෙන *ගැසට්* පත්‍රයේ දැන්වීම් 2024 මාර්තු මස 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට්* පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට්* පත්‍රය *www. documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# බඩු බාහිරාදිය විකිණීම්

**මහෙස්ත්‍රාත් අධිකරණය - කුලියාපිටිය**

කුලියාපිටිය මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 80018 දරන නඩුවට අදාළව රාජසන්තක කරන ලද පහත උපලේඛනයේ සඳහන් වතුර ටැංකි 8 ක් **2024.03.30** වැනි දින පෙරවරු **10.00** ට දුම්මලසූරිය පොලිස් ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. පහත උපලේඛනයේ සඳහන් වතුර ටැංකි පිළිබඳ හිමිකම් දක්වන යම් තැනැත්තෙක් සිටී නම්, වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින **පෙ.ව. 9.45** ට පෙර ස්වකීය හිමිකම් තහවුරු කළ යුතු ය.

03. වෙන්දේසිය පැවැත්වෙන දින **පෙ.ව. 8.30 සිට පෙ.ව. 9.30** දක්වා මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබාගෙන වතුර ටැංකි පරීක්ෂා කර බැලිය හැකිය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව පිළිනොගන්නා අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම වතුර ටැංකි වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසි භූමියට පැමිණෙන්නන් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම පිණිස ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

06. වෙන්දේසියේ දී මිල දී ගන්නා වතුර ටැංකි සඳහා එම අවස්ථාවේදී ම මුදලින් ම පමණක් ගෙවීම් කළ යුතු ය.

එම්. ඩී. රන්දික ලක්මාල් ජයලත්,
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
කුලියාපිටිය.

2024 පෙබරවාරි මස 28 වැනි දින,
කුලියාපිටිය මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**උපලේඛනය**

***අංක 80018 දරන නඩුවට අදාළ රාජසන්තක කරන ලද වතුර ටැංකි***

| *අනු අංකය* | *භාණ්ඩ වර්ගය* | *ප්‍රමාණය* |
|---|---|---|
| 1 | ආර්පිකෝ වර්ගයේ ලීටර් 5000 වතුර ටැංකි | 08 |

03 - 254

---

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - කැබිතිගොල්ලෑව**

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ, හිමිකම් නොපාන ලද සහ අංක රහිත පහත සඳහන් නඩු භාණ්ඩ **2024.04.01** වැනි දින **පෙ.ව. 09.30** ට කැබිතිගොල්ලෑව මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ඇතිව වෙන්දේසි දින නියමිත වේලාවට **පැය 1/2** කට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ මහජනයාට පරීක්ෂා කර බැලිය හැකිය.

02. අධිකරණය විසින් නියම කරන ලද අවම ලංසුව පිළිනොගැනෙන අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

03. වෙන්දේසියෙන් මිල දී ගනු ලබන භාණ්ඩ සඳහා එවලේම මුදල් ගෙවිය යුතු අතර, එදිනම ප.ව. 3.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් ආදිය භාර ගනු නොලැබේ.

04. වෙන්දේසියෙන් මිල දී ගන්නා ලද භාණ්ඩ සඳහා ගැණුම්කරු විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ පිළිගතහැකි හැඳුනුම්පතක් ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.

05. වෙන්දේසියෙන් මිල දී ගන්නා වැලි හා බොරළු අධිකරණයෙන් පිටතට රැගෙන යාම සඳහා අවශ්‍ය බලපත්‍රයන් ගැණුම්කරුවන් විසින් සපයාගත යුතුය.

06. වෙන්දේසිය පිළිබඳව පැමිණිලි කිසිවක් වෙතොත්, එදින වෙන්දේසියේ රාජකාරි අවසන්වීමට පෙර අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත දැන්විය යුතු අතර, ඊට පසුව ලැබෙන පැමිණිලි භාරගනු නොලැබේ.

07. මෙම භාණ්ඩ වෙන්දේසිය පිළිබඳව සියලුම කටයුතු අධිකරණයේ අභිමතය පරිදි සිදු කරන බවද වැඩි දුරටත් සඳහන් කරමි.

කසුන් කාංචන දසනායක,<br>
දිසා විනිසුරු සහ මහෙස්ත්‍රාත්,<br>
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,<br>
කැබිතිගොල්ලෑව.

2024 පෙබරවාරි මස 22 වැනි දින,<br>
කැබිතිගොල්ලෑව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**උපලේඛනය**

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | 16745 | පොරව,<br>දිග අඩි 14 ක් වන යකඩ කේබලය | 01<br>01 |
| 02 | 15954 | මිට සහිත පොරොව<br>කටු කම්බි කි.ග්‍රෑ. 3.3 | 01<br>01 |
| 03 | 16872 | ඇලුමිනියම් භාජන | 02 |
| 04 | 4425 | ඇලුමිනියම් තාච්චි (ලොකු) | 01 |
| 05 | 98886 | මධ්‍ය ප්‍රමාණයේ කහ පැහැති බූලිය | 01 |
| 06 | 4985 | තණකොළ කපන මැෂිම<br>කැති | 01<br>01 |
| 07 | | පොරෝ<br>සවල්<br>උදළු<br>කැති | 11<br>12<br>14<br>47 |
| 08 | | බූලි<br>ලොකු<br>පොඩි | <br>20<br>20 |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 09 | | ප්ලාස්ටික් භාජන (බකට්) - ලොකු<br>පොඩි | 04<br>01 |
| 10 | | ඇලුමිනියම් මුට්ටි | 02 |
| 11 | | ප්ලාස්ටික් බේසම් | 01 |
| 12 | | වීදුරු බෝතල් | 250 |
| 13 | | රබර් බට දමා ඇති පොහොර උර | 01 |
| 14 | 7956 | විදුලි ජනක යන්ත්‍රය | 01 |
| 15 | 4332 | ෆයිබර් ග්ලාස් යාත්‍රා<br>කොල්ලෑ | 02<br>02 |
| 16 | 94441 | අශ්ව බල 15 භූමිතෙල් එන්ජින්<br>ෆයිබර් ග්ලාස් බෝට්ටු | 01<br>01 |
| 17 | 89876 | ට්‍රැක්ටර් ටේලරය (අබ්ලි) | 01 |
| 18 | 7381 | NCABG 7740 දරන ත්‍රීරෝද රථය | 01 |
| 19 | 85289 | NCGA 2324 හොණ්ඩා CD 50 වර්ගයේ යතුරු පැදිය | 01 |
| 20 | 96199 | NCXS - 4058 යතුරු පැදිය | 01 |

03 - 255

---

## මහාධිකරණය - අවිස්සාවේල්ල

### අවිස්සාවේල්ල මහාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ හා හිමිකම් නොපාන ලද නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. අවිස්සාවේල්ල මහාධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරන ලද හා හිමිකම් නොකියන ලද පහත සඳහන් භාණ්ඩ **2024.04.03 වැනි දින ප.ව. 1.30** ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය පරිදි මහජනයාට පරීක්ෂා කර බැලිය හැකි වේ.

03. මෙම වෙන්දේසි කරනු ලබන කිසියම් භාණ්ඩයක් පිළිබඳව අයිතිවාසිකම් කියන්නෙකු වේ නම් ඒ පිළිබඳව වෙන්දේසිය පවත්වනු ලබන දිනට පෙර ස්වකීය හිමිකම් ලියවිල්ලක් මගින් මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වේ.

04. වෙන්දේසියෙන් මිල දී ගන්නා භාණ්ඩ ඒ අවස්ථාවේ දී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර, සියලු ගෙවීම් මුදලින් පමණක් කළ යුතුය.

05. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

06. වෙන්දේසියට සහභාගී වීමට පැමිණෙන්නන් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

07. වෙන්දේසිය සම්බන්ධයෙන් පැමිණිලි කිසිවක් තිබේනම් වෙන්දේසිය පවත්වන අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු අතර, වෙන්දේසියෙන් පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

ඩී. ඒ. රුවන් පතිරණ,
බස්නාහිර පළාත් මහාධිකරණ විනිසුරු,
මහාධිකරණය,
අවිස්සාවේල්ල.

2024 මාර්තු මස 05 වැනි දින,
අවිස්සාවේල්ල මහාධිකරණයේ දී ය.

**රාජසන්තක ගරන ලද හා හිමිකම් නොපාන ලද නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමේ භාණ්ඩ ලැයිස්තුව**

වෙන්දේසි දිනය : **2024.04.03 වේලාව ප.ව. 1.30**

| අනු. අංකය | නඩු අංකය | විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | 55/13 | SGVP - 6670 - TVS යතුරු පැදිය | 01 |
| 02 | 57/15 | SGAAA -2432 - ත්‍රිරෝද රථය | 01 |
| 03 | 77/12 | WPGB - 3676 - යමහා වර්ගයේ යතුරු පැදිය | 01 |
| 04 | 66/14 | 202 - 5990 ත්‍රීවිල් රථයක කොටස් | 01 |
| 05 | 73/13 | SPUE - 1278 - යතුරු පැදි | 01 |
| 06 | 109/17 | SGAAK - 4608 දරන නිල්පාට බජාජ් ත්‍රිරෝද රථය | 01 |
| 07 | 47/13 | 83 ශ්‍රී 7186 යතුරු පැදි | 01 |

03 - 283

---

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - මොරටුව**

නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම - 2024

මොරටුව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන ලද පහත සඳහන් භාණ්ඩ **2024 මාර්තු මස 27 වැනි දින ප.ව. 01.30** ට මොරටුව අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. උපලේඛනයේ සඳහන් භාණ්ඩ පිළිබඳ හිමිකම් කියන්නන් සිටී නම් වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ලිඛිතව ඉදිරිපත්කළ යුතුය.

02. රෙජිස්ට්‍රාර්වරයා විසින් එදින **ප.ව. 1.00 සිට ප.ව. 1.30** අතර කාලය තුළ වෙන්දේසි භාණ්ඩ පරීක්ෂාවට ඉඩ දෙනු ලැබේ.

03. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව පිළි නොගැනෙන අවස්ථාවල දී එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

04. වෙන්දේසියෙන් මිල දී ගනු ලබන භාණ්ඩ සඳහා අත්පිට මුදල් ගෙවිය යුතු අතර, චෙක්පත් මුදල් ඇනවුම් ආදිය භාරගනු නොලැබේ.

05. වෙන්දේසි භූමියට පැමිණීමේ දී අනන්‍යතාවය තහවුරු කිරීමට ජාතික හැඳුනුම්පත අත්‍යවශ්‍ය වේ.

06. වෙන්දේසියෙන් මිල දී ගනු ලබන භාණ්ඩ එවෙලේ ම වෙන්දේසි භූමියෙන් ඉවත් කර ගත යුතුය.

උද්දාල සුවන්දුරුගොඩ,
අතිරේක දිසා විනිසුරු සහ අතිරේක මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය, මොරටුව.

2024 මාර්තු මස 06 වැනි දින,
මොරටුව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**උපලේඛනය**

| *අනු අංකය* | *නඩු අංකය* | *PR අංකය* | *භාණ්ඩය* |
|---|---|---|---|
| 01 | AR 2320/2022 | PR 536/2022 | XK 5249 BAJAJ DISCOVER 125 යතුරු පැදිය (අබිලි) |
| 02 | AR 2316/2022 | PR 609/2021 | HS 7049 WINNER GN 125 යතුරු පැදිය (අබිලි) |
| 03 | 88628 | PR 354/2020 | MZ 7573 HERO HONDA 100 CC යතුරු පැදිය (අබිලි) |
| 04 | 99550 | PR 574/2022 | BAJAJ AUTO 150 CC 202 - 3770 ත්‍රිරෝද රථය (අබිලි) |
| 05 | 74898 | PR 1185/2019 | BAJAJ RE 198 CC ABK 8187 ත්‍රිරෝද රථය (අබිලි) |
| 06 | 85827 | PR 4395/2019 | XY 1740 BAJAJ PULSAR 150 යතුරු පැදිය (වාහන) |
| 07 | AR 2315/2022 | PR 178/2022 | 04 g ක් බර රන් මාලයක් |
| 08 | AR 3054/2023 | PR 663/2023 | LENOVO වර්ගයේ ලැප්ටොප් පරිගණකය, |
| 09 | AR 3054/2023 | PR 3872/2023 | ASUS වර්ගයේ ලැප්ටොප් පරිගණකය, චාජරය හා මවුස් එක |
| 10 | AR 3053/2023 | PR 2025/2023 | NIKON DIGITAL වර්ගයේ කැමරාව, චාජරය, කාච 02 හා කණ්ණාඩි කුට්ටම |
| 11 | 65576 | - | ACER වර්ගයේ ලැප්ටොප් පරිගණකය |
| 12 | AR 574/2015 | PR 1755/2015 | වාමුව පිස්නා 02 ක් (වයිපර්) |
| 13 | 89253 | PR 369/2020 | පැඩිං 4 kg යි. කඩදාසි 05 kg යි |
| 14 | 02582 | PR 590/2022 | වයර් රෝලක් |
| 15 | 11273 | PR 3468/2023 | බොයිලේරුවක් |
| 16 | 86205 | PR 460/2020 | ලිප් දෙකේ ගෑස් ලිපක් |
| 17 | 86205 | PR 460/2020 | 12.5 kg ගෑස් සිලින්ඩරයක් |
| 18 | 86205 | PR 460/2020 | ඇළුමිනියම් කලයක් |
| 19 | 86205 | PR 460/2020 | යකඩ බට 01 ක් හා ප්ලාස්ටික් බාල්දියක් |
| 20 | 02082 | PR 3963/2022 | වොට් 12 ප්‍රමාණයේ එක්සයිඩ් බැටරි 02 යි |
| 21 | 02082 | PR 3963/2022 | ඇම්කෝ වර්ගයේ සුදු, නිල් පාට බැටරි 01 ක් |
| 22 | 08164 | PR 759/2023 | එක්සයිඩ් වර්ගයේ වාහන බැටරි 01 ක් |
| 23 | 94949 | PR 5708/2020 | 12.5 kg ලාෆ් ගෑස් සිලින්ඩරයක් |
| 24 | 14645 | PR 576/2023 | බෝතල් මූඩි මුද්‍රා උපකරණය |
| 25 | 14645 | PR 576/2023 | පිරිසිදු කරන ලද වීදුරු බෝතල් 28 ක් අඩංගු ඉටි ඇසුරුමක් |

| අනු අංකය | නඩු අංකය | PR අංකය | භාණ්ඩය |
|---|---|---|---|
| 26 | 14645 | PR 576/2023 | පිරිසිදු කරන ලද වීදුරු බෝතල් 27 ක් අඩංගු ඉටි ඇසුරුමක්/ බෝතල් මූඩි 104 ක් අඩංගු ඇසුරුමක් |
| 27 | AR 631/2019 | PR 607/2019 | අඟල් 7 x 5 ප්‍රමාණයේ පිත්තල කැබලි 32 ක් |
| 28 | 12561 | PR 6987/2023 | ඇක්සල් 01 ක්<br>රිම් වළලු සවිකරන බ්‍රැකට් 07 ක් |
| 29 | අංක රහිත | - | ජනෙල් ග්‍රිල් 01 ක් |
| 30 | අංක රහිත | - | පැන්ට්‍රි කබඩ් දොර 02 ක් |
| 31 | අංක රහිත | - | වීදුරු/ලී ජනෙල් පියනක් |
| 32 | අංක රහිත | - | මේස විදුලි පංකාවක් |

03 - 285

---

## මහෙස්ත්‍රාත් අධිකරණය - මැදවච්චිය

### ප්‍රසිද්ධ භාණ්ඩ වෙන්දේසිය

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ, හිමිකම් නොපාන ලද, නඩු අංක මැකී ඇති, නඩු වාර්තා සොයා ගැනීමට අපහසු පහත සඳහන් භාණ්ඩ **2024.03.30 වැනි දින පෙ.ව. 10.00** ට මැදවච්චිය මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩවලට හිමිකම් දක්වන්නේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර හෝ එදින වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථම ස්වකීය හිමිකම් ලියවිල්ලක් මගින් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරිය වෙත ඉදිරිපත් කළ යුතුය.

03. රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය ඇතිව වෙන්දේසි දින නියමිත වේලාවට පැය 1/2 කට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ මහජනයාට පරීක්ෂා කර බැලිය හැකිය.

04. අධිකරණය විසින් නියම කරන ලද අවම ලංසුව පිළිනොගැනෙන අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිල දී ගනු ලබන භාණ්ඩ එවෙලේ ම මුදල් ගෙවා **ප. ව. 03.00** ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය. සියළුම ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

06. වෙන්දේසි භූමියට පැමිණෙන සෑම අයෙකු විසින් ම තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ පිළිගත හැකි හැඳුනුම්පතක් ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.

07. වෙන්දේසිය පිළිබඳව පැමිණිලි කිසිවක් වෙතොත් එදින වෙන්දේසියේ රාජකාරි අවසන් වීමට පෙර අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරිය වෙත දැන්විය යුතු අතර, ඊට පසුව ලැබෙන පැමිණිලි භාර ගනු නොලැබේ.

08. මෙම භාණ්ඩ වෙන්දේසිය පිළිබඳව සියලුම කටයුතු අධිකරණයේ අභිමතය පරිදි සිදු කරන බවද වැඩිදුරටත් සඳහන් කරමි.

ඉමේෂා මධුභානි ධර්මදාස,
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය - මැදවච්චිය.

2024 මාර්තු මස 06 වැනි දින,
මැදවච්චිය මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**උපලේඛනය**

| අනු. අංකය | නඩු අංකය | විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | 4776 | පොරොව | 01 |
| 02 | 70277 | පොරොව | 01 |
| 03 | 6031 | පොරොව | 01 |
| 04 | 1477 | උදලු | 01 |
| 05 | 4547 | උදලු | 01 |
| 06 | AR 269/23 | මැටි කලගෙඩි | 01 |
| 07 | AR 267/23 | ඇලුමිනියම් කලගෙඩි | 01 |
| 08 | 4692 | මිට දිග කැති | 01 |
| 09 | 4794 | පිකස්<br>උදලු<br>යකඩ ඉනි | 01<br>01<br>01 |
| 10 | 184 | ප්ලාස්ටික් පැදුරු | 01 |
| 11 | 171 | ප්ලාස්ටික් පැදුරු | 02 |
| 12 | 1476 | හැමර්<br>යකඩ කටු<br>රබර් බට | 01<br>01<br>01 |
| 13 | 1236 | තරාදි | 01 |
| 14 | 3473 | ප්ලාස්ටික් කල ගෙඩි<br>ඇලුමිනියම් තාච්චි<br>යකඩ අලවංගු<br>උදළු<br>ජැක්<br>බෙල්ට්<br>මුල්ලු<br>කුළුගෙඩි<br>යකඩ බාල්දි<br>පොරොව | 01<br>01<br>02<br>01<br>01<br>01<br>01<br>01<br>01<br>01 |
| 15 | 2938 | ස්ටීමර් | 01 |
| 16 | 51773 | අංක NC BHF 9646 - යතුරු පැදි | 01 |
| 17 | 2522 | අංක NP VU 7277 - යතුරු පැදි | 01 |
| 18 | 3197 | අංක රහිත ට්‍රැක්ටර් ට්‍රේලර | 01 |
| 19 | අංක රහිත | යකඩ බැරල් | 10 |
| 20 | අංක රහිත | ප්ලාස්ටික් බූලි | 20 |
| 21 | අංක රහිත | වීදුරු බෝතල් | 120 |

03 -312

## දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - තංගල්ල

අධිකරණයට ඉදිරිපත්කර රාජසන්තක කරන ලද භාණ්ඩ හා තංගල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 45820 දරන නඩුවට අදාළ භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. තංගල්ල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරන ලද මෙතෙක් හිමිකම් නොකියන ලද සහ ප්‍රසිද්ධියේ වෙන්දේසි කිරීමට නියම කරන ලද මෙහි පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ **2024.04.09** වැනි දින **පෙ.ව. 10.00** ට අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි උපලේඛනයේ සඳහන් කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් පාන්නෙකු වේ නම්, ප්‍රසිද්ධ වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින ප්‍රසිද්ධ වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතුය. වෙන්දේසියෙන් පසු ඉදිරිපත් කරන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ පූර්ව අවසරය ලබා ගෙන වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර වෙන්දේසියට නියමිත භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකිය.

04. අධිකරණය විසින් නියම කරන අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිල දී ගන්නා භාණ්ඩ එම අවස්ථාවේ දී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය. සියලුම ගෙවීම් මුදලින් ගෙවිය යුතු අතර, චෙක්පත් හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

06. වෙන්දේසි භූමියට පැමිණෙන අය තමන්ගේ අනන්‍යතාවය තහවුරු කළ යුතුය.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - තංගල්ල.

2024 මාර්තු මස 07 වැනි දින,
තංගල්ල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**උපලේඛනය**

| අ/අ. | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය | මිල (රු) |
|---|---|---|---|---|
| 01 | AR 488/22 | සවල | 01 | 200.00 |
| 02 | AR 1020/22 | TOMA HAWK වර්ගයේ මවුන්ටන් පාපැදිය | 01 | 2,000.00 |
| 03 | 50007 | යකඩ බැරල් | 01 | 250.00 |
| 04 | 53245 | ගුරු පාට ප්ලාස්ටික් බැරල් | 01 | 200.00 |
| 05 | 53361 | නිල් පැහැති බූලි<br>යකඩ බැරල්<br>ලිට්‍රෝ වර්ගයේ හිස් ගෑස් සිලින්ඩර්<br>රෙගියුලේටරය සහිත උඳුන් 04 ගෑස් ලිප් | 01<br>01<br>01<br>01 | 5,300.00 |
| 06 | 53581 | කලු පැහැති slon වර්ගයේ ප්ලාස්ටික් ජල ටැංකි | 01 | 1,000.00 |
| 07 | 53582 | යකඩ බැරල්<br>කහ පැහැති ප්ලාස්ටික් බූලි | 01<br>01 | 300.00 |

| අ/අ. | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය | මිල (රු) |
|---|---|---|---|---|
| 08 | 53753 | නිල් පැහැති ප්ලාස්ටික් බැරල් | 01 | 200.00 |
| 09 | 53898 | 12.5 kg නිල් පැහැති ගෑස් සිලින්ඩර්<br>රෙගියුලේටර් සහිත ගෑස් ලිප්<br>කලු හෝස් බට කැබලි<br>නිල් පාට හෝස් බට කැබලි<br>නිල් පැහැති බේසම්<br>කහ පැහැති ගැලුම් | 01<br>01<br>01<br>01<br>01<br>01 | 5,000.00 |
| 10 | 53928 | නිල් පාට ප්ලාස්ටික් බැරල් | 01 | 200.00 |
| 11 | 54632 | යකඩ බැරල් | 01 | 200.00 |
| 12 | 54655 | නිල් පැහැති ප්ලාස්ටික් බැරල්<br>යකඩ බැරල් | 02<br>01 | 600.00 |
| 13 | 55042 | ප්ලාස්ටික් බැරල්<br>යකඩ බැරල් | 08<br>01 | 2,000.00 |
| 14 | 53246 | කහ පාට ප්ලාස්ටික් බූලි | 02 | 100.00 |
| 15 | 53250 | නිල් පැහැති ප්ලාස්ටික් බූලි (කෑන්) | 01 | 50.00 |
| 16 | 54656 | කලු පැහැති ප්ලාස්ටික් බූලි | 01 | 50.00 |
| 17 | 51958 | කලාල | 01 | 200.00 |
| 18 | 51875 | පැදුරු | 01 | 50.00 |
| 19 | 54855 | ඇලුමිනියම් කල<br>සුදු පාට ප්ලාස්ටික් බාස්කට් | 01<br>01 | 150.00 |
| 20 | 55104 | ප්ලාස්ටික් බූලි | 01 | 50.00 |
| 21 | 55103 | යකඩ බැරල් | 01 | 250.00 |
| 22 | 53602 | රතු පැහැති කාපට් | 01 | 350.00 |
| 23 | 55197 | යකඩ බැරල්<br>12.5 kg ලිට්රෝ ගෑස් සිලින්ඩර්<br>යකඩ ගෑස් ලිප් | 01<br>01<br>01 | 4,200.00 |
| 24 | 55234 | යකඩ බැරල් | 01 | 250.00 |
| 25 | 54305 | ප්ලාස්ටික් බූලි | 01 | 50.00 |
| 26 | 53999 | යකඩ බැරල් | 01 | 250.00 |
| 27 | 54462 | ප්ලාස්ටික් බැරල් | 01 | 200.00 |
| 28 | 54381 | යකඩ බැරල් | 01 | 250.00 |
| 29 | 55015 | ප්ලාස්ටික් බූලි | 01 | 50.00 |
| 30 | - | බෝතල් තොගයක් | 01 | 150.00 |

| අ/අ. | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය | මිල (රු) |
|---|---|---|---|---|
| කාර්යාල උපකරණ | | | | |
| 31 | - | R 150 වර්ගයේ RM 2550 AW දරන රෝනියෝ මැෂින් | 01 | 2,500.00 |
| 32 | - | Cannon වර්ගයේ IR 2200 දරන ඡායා පිටපත් යන්ත්‍ර | 01 | 2,000.00 |
| තංගල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද වාහන | | | | |
| 33 | 51714 | අත් ට්‍රැක්ටරය | 01 | 10,000.00 |
| 34 | 24861 | 48 - 4542 දරන අබිලන් ලොරි රථය | 01 | 200,000.00 |
| 35 | 40068 | LG - 6411 දරන ලොරි රථය | 01 | 300,000.00 |
| 36 | 49722 | PP - 4961 දරන පෝටෝන් වර්ගයේ ලොරි රථය | 01 | 500,000.00 |

**තංගල්ල ම.උ නඩු අංක 45820 දරන නඩුවට අදාළ රාජසන්තක කර ඇති භාණ්ඩ**

| | | | | |
|---|---|---|---|---|
| 01 | 45820 | වෙළඳ භාණ්ඩ අසුරන ලද ලොකු රාක්ක (3'9" x 1'6" x 5'6" - තට්ටු 5) | 07 | 242,725/- |
| 02 | | වෙළඳ භාණ්ඩ අසුරන ලද කුඩා රාක්ක<br>I. සුදු පැහැති - 4' x 1'3" x 5'6"<br>II. සුදු පැහැති - 3' x 1'6" x 6'<br>III. එළවළු තැබීමට ඇති රාක්ක - 4' x 1'4" x 5'6"<br>IV. දැව රාක්ක - 3' x 1'8" x 4" | <br>09<br>06<br>01<br>01 | <br>188,100/-<br>122,550/-<br>28,500/-<br>7600/- |
| 03 | | I. අධි ශීතකරණය - (Soala 8' 3" x 2'9" x 2'9"<br>II. අධි ශීතකරණය - (Soala 7' 2' 9" x 2'9"<br>III. දොර දෙකේ ශීතකරණ - Abans 3'9" x 1'8"<br>IV. දොර තුනේ ශීතකරණය - (Bottle Cooler) | 01<br>01<br>01<br>01 | 308,750/-<br>279,300/-<br>54,150/-<br>228,000/- |
| 04 | | වීදුරු කබඩ් - 3'2" x 1'6" x 6' | 01 | 19,000/- |
| 05 | | රෝද හතරක් සහිත ලොකු ට්‍රොලි | 05 | 76,000/- |
| 06 | | මළ නොබැඳෙන කුඩා කුඩා - 1'4" x 1'9" | 12 | 22,800/- |
| 07 | | වායු සමීකරණ යන්ත්‍ර (Media R 32) | 02 | 209,000/- |
| 08 | | CCTV කැමරා පද්ධතිය (රූපවාහිනිය සමඟ) | 01 | 213,750/- |
| 09 | | I. මුදල් අයකැමි පරිගණක යන්ත්‍රය හා එම උපාංග<br>II. කුඩා මේසය - (1'9" x 1'9" x 2'9")<br>III. බිල් කරන මේසය - (1'9" x 5 x 2'9")<br>IV. කුඩා රවුම් හැඩයේ ස්ටූල් එක | 01<br>01<br>01<br>01 | 66,500/-<br>6,650/-<br>14,250/-<br>2,850/- |

| අ/අ. | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය | මිල (රු) |
|---|---|---|---|---|
| 10 | | I. කැෂියර් පුටුව<br>II. කැෂියර් මේසය (රවුම් හැඩති) | 01<br>01 | 16,625/-<br>43,700/- |
| 11 | | ඉලෙක්ට්‍රොනික් තරාදි<br>I. ලොකු තරාදි - බඩ්රි ඉලෙක්ට්‍රොනික්ස්<br>II. කුඩා තරාදි - බඩ්රි ඉලෙක්ට්‍රොනික්ස් | <br>01<br>01 | <br>61,750/-<br>142,500/- |
| 12 | | ධාන්‍ය බහාලන රාක්ක (Bulk bin)<br>I. ලොකු රාක්ක<br>II. කුඩා රාක්ක | <br>01<br>02 | <br>33,250/-<br>57,000/- |
| 13 | | වෙළඳසැලේ ඉදිරිපස හා පිටුපස සවිකරන ලද වීදුරු දොර සහිත වීදුරුව (පාටිෂන්) | - | 357,000/- |
| 14 | | වෙළඳසැල ඉදිරිපස ඉදිකර ඇති කැනපිය | - | 191,000/- |
| 15 | | උඩුමහලේ මුළුතැන්ගේ සඳහා කරන ලද පාටිෂන් | - | 74,700/- |
| 16 | | වෙළඳසැල ඉදිරිපස සවිකර ඇති නාම පුවරු<br>I. 5" යකඩ කණුව මත ඉදිකරන ලද නාම පුවරුව<br>II. 23' x 2'6" ප්‍රමාණයට ඇති ඩිජිටල් තිරය සහිත නාම පුවරුව | <br>-<br>- | <br>24,700/-<br>14,250/- |
| 17 | | ස්ප්‍රින් මෙට්ට (Heyleys - 4 ft) | 01 | 21,375/- |
| 18 | | වෙළඳසැල ඉදිරිපස පඩිපෙල යට ඉදිකරන ලද යකඩ කූඩුව | - | 32,000/- |

03 - 317

---

**මහෙස්ත්‍රාත් අධිකරණය - තඹුත්තේගම**

අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

තඹුත්තේගම මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු වලට අදාළ පහත උපලේඛනයේ සඳහන් රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ **2024.03.30** වැනි දින පෙ.ව. 9.30 ට අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි උපලේඛනයේ සඳහන් කිසියම් භාණ්ඩයක් පිළිබඳව හිමිකම් කියන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතුය.

03. අධිකරණයේ රෙජිස්ට්‍රාර්ගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2 කට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ මහජනතාවට පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි මෙම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතියත් අධිකරණය සතු ය.

05. වෙන්දේසියෙන් මිල දී ගනු ලබන භාණ්ඩ සඳහා එවලෙහිම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කරවා ගත යුතුය.

06. සියලුම ගෙවීම් මුදලින් සිදු කළ යුතු අතර චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

07. ගැනුම්කරුවන් සිය ජාතික හැඳුනුම්පත හෝ වෙනත් පිළිගත හැකි හැඳුනුම්පතක් මගින් අනන්‍යතාවය තහවුරු කළ යුතුය.

බුද්ධික මල්වත්ත,
මහෙස්ත්‍රාත් - තඹුත්තේගම.

2024 මාර්තු මස 01 වැනි දින,
තඹුත්තේගම මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**උපලේඛනය**

| | *නඩු අංකය* | *නඩු භාණ්ඩ විස්තර* |
|---|---|---|
| 01 | 05030 | පුරවන ලද අත් ට්‍රැක්ටරයක ප්‍රමාණයේ වැලි තොගයක් |
| 02 | 04022 | බොරලු කියුබ් 03 |
| 03 | 05507 | බොරලු කියුබ් 03 |
| 04 | 05332 | බොරලු කයුබ් 01 |
| 05 | අංක රහිත | වීදුරු බෝතල් 500 |
| 06 | අංක රහිත | හිස් වඩි බැරල් 50 |
| 07 | අංක රහිත | ලොකු ප්ලාස්ටික් බූලි 75 |
| 08 | P - 09 | ලියාපදිංචි අංක රහිත DAYANA වර්ගයේ යතුරු පැදිය |
| 09 | P - 12 | ලියාපදිංචි අංක රහිත KINDO වර්ගයේ නිල්පාට යතුරු පැදිය |
| 10 | P - 13 | ලියාපදිංචි අංක රහිත මෝපේඩ් වර්ගයේ අබිලන් යතුරු පැදිය |
| 11 | P - 17 | 10 ශ්‍රී 471 Mate 50 වර්ගයේ යතුරු පැදිය |
| 12 | P - 21 | ලියාපදිංචි අංක රහිත සුසුකි 125 වර්ගයේ යතුරු පැදිය |
| 13 | P - 23 | ලියාපදිංචි අංක රහිත අත් ට්‍රැක්ටර් ටේලරය |
| 14 | P - 24 | ලියාපදිංචි අංක රහිත අත් ට්‍රැක්ටර් ටේලරය |
| 15 | 57520 | අංක CPQP 5815 ත්‍රිරෝද රථය |
| 16 | 37409 | අංක BDT 8967 යතුරු පැදිය |
| 17 | 85304 | NCLA 5472 බොලෙරෝ කැබ් රථය |
| 18 | 84268 | අංක NC XI 6487 යතුරු පැදිය |
| 19 | AR 579/21 | අංක NW TM 0791 යතුරු පැදිය |

03 - 341

# රජයේ නොවන දැන්වීම්

**මෝතා ඉන්වෙස්මන්ට්ස් කෝපරේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්**

සමාගම් අංකය පීවී 13873

සාමාජිකයන්ගේ ස්වේච්ඡා ඇවර කිරීම

**2007 අංක 07 දරන සමාගම් පනතේ 320 (1) වන වගන්තිය ප්‍රකාරව වූ නිවේදනයයි**

සාමාජිකයන්ගේ ස්වේච්ඡා ඇවර කිරීමක් වශයෙන් මෙම සමාගම ඇවර කිරීමටත්, කොළඹ 3, පාසල් වීදියේ අංක 09, තුන් වන මහලේ වරලත් ගණකාධිකාරී විදාන ආරච්චිලාගේ චානක පුෂ්පකුමාර වන මා සමාගමේ ඇවරකරු වශයෙන් වර්ෂ 2024 ක් වූ මාර්තු මස 12 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කිරීමටත්, කොළඹ 03, පාසල් වීදියේ අංක 09, තුන්වන මහලේ දී වර්ෂ 2024 ක් වූ මාර්තු මස 12 වැනි දින පවත්වනු ලැබූ මෙම සමාගමේ අති විශේෂ මහා සභා රැස්වීමක දී 2007 අංක 7 දරන සමාගම් පනතේ (319)(1)(ආ) යටතේ යෝජනා සම්මතයක් අනුමත කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 320(1) දරන වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

විදාන ආරච්චිලාගේ චානක පුෂ්පකුමාර,
ඇවරකරු.

අංක 09, 03 වන මහල,
පාසල් පටුමග, කොළඹ 03.

03 - 263/1

---

**මෝතා ඉන්වෙස්මන්ට්ස් කෝපරේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්**

සමාගම් අංකය පීවී 13873

ඇවරකරු පත් කිරීමේ නිවේදනය

**2007 අංක 07 දරන සමාගම් පනතේ 346 (1) වන වගන්තිය ප්‍රකාරව වූ නිවේදනයයි**

වර්ෂ 2024 ක් වූ මාර්තු මස 12 වැනි දින පවත්වනු ලැබූ මෙම සමාග මේ අති විශේෂ මහා සභා රැස්වීමක දී මෝතා ඉන්වෙස්මන්ට්ස් කෝපරේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ ඇවරකරු වශයෙන් සමාගමේ විශේෂ යෝජනා සම්මතයෙන් මා පත් කරන ලද බව කොළඹ 3, පාසල් වීදියේ අංක 09, තුන් වන මහලේ වරලත් ගණකාධිකාරී විදාන ආරච්චිලාගේ චානක පුෂ්පකුමාර වන මම මෙයින් නිවේදනය කරමි.

විදාන ආරච්චිලාගේ චානක පුෂ්පකුමාර,
ඇවරකරු.

අංක 09, 03 වන මහල,
පාසල් පටුමග, කොළඹ 03.

03 - 263/2

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) ප්‍රකාර 11(5) වගන්තිය සහ 8 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව "ලංකා ඩේරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්" සමාගමේ නාමය "ලංකා ඩේරීස් ලිමිටඩ්" යනුවෙන් වෙනස් කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| | | |
|---|---|---|
| පෙර නාමය | : | ලංකා ඩේරීස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| ලියාපදිංචි අංකය | : | පීවී 3397 |
| ලියාපදිංචි ලිපිනය | : | වැලිසර, රාගම |
| නව නාමය | : | ලංකා ඩේරීස් ලිමිටඩ් |

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝග යටතේ,

එච්. කේ. බුලත්වත්ත,
සමාගම් ලේකම්.

2024 පෙබරවාරි මස 27 වැනි දින.
ලංකා ඩේරීස් ලිමිටඩ්,
වැලිසර.

03 - 307

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**ඩීඑෆ්සීසී බැන්ක් පී.එල්.සී.**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

සේදවත්ත පාරේ, වරිපනම් අංක 224 දරන ස්ථානයේ පිහිටි පිළිවෙලින් රූඩ් 01, පර්චස් 16.25ක් (හෙක්ටයාර් 0.142271) සහ පර්චස් 31 විශාලැති අගනා ඉඩම්.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දකුණු අළුත්කුරු කෝරළේ, අඹතලෙන් පහළ කොළොන්නාව නගර සභා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සේදවත්ත ග්‍රාම නිලධාරි වසමේ අඹතලෙන් පහළ සේදවත්ත පාරට ඔබ්බෙන් පිහිටා ඇති සේදවත්ත පාරේ වරිපනම් අංක 224 දරන පරිශ්‍රයට බලයලත් මිනින්දෝරු කේ. නඩරාජා විසින් 1998 ජූලි මස 14 වැනි දින නැවත මැන සාදන ලද අංක 2925A දරන පිඹුරේ ඒකාබද්ධ කරන ලද ලොට් 1cx දරන "අඹගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. කනගසිංගම් විසින් 2012 සැප්තැම්බර් මස 1 වැනි දින මැන සාදන ලද අංක 2677 දරන (1998 ජූලි මස 14 වැනි දින බලයලත් මිනින්දෝරු කේ. නඩරාජා විසින් සාදන ලද 2174 දරන පිඹුරේ නිරූපිත ලොට් X) පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට් 1 ඉඩම් කැබැල්ල සමග එහි පිහිටි පස, ගහකොළ, වැවිළි සහ සෑම සියලු දේ සහ

ඉහත කී 509A දරන සේදවත්ත ග්‍රාම නිලධාරි වසමේ, සේදවත්තේ පිහිටා ඇති සේදවත්ත පාරේ වරිපනම් අංක 222 දරන "අඹගහවත්ත" නමැති ඉඩමට (බලයලත් මිනින්දෝරු ජී. එච්. පිලිප්ස් විසින් 1984 අගෝස්තු මස 31 වැනි දින සාදන ලද අංක 2250 දරන පිඹුරේ නිරූපිත නැවත බෙදා ඒකාබද්ධ කොට ඒ මත තබා ඇති සටහන සහ බලයලත් මිනින්දෝරු ඒ. ඩී. සිරිසේන විසින් 1980 දෙසැම්බර් මස 08 වැනි දින සාදන ලද අංක 3957 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කර ඇති ලොට් 1 සහ 2 දරන බිම් කැබලි) බලයලත් මිනින්දෝරු විසින් සාලිය වික්‍රමසිංහ විසින් 2013 මැයි මස 17 වැනි දින මැන සාදන ලද අංක 12614 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කොට මායිම් නිරූපනය කොට ඇත්තා වූ ලොට් X දරන බිම් කැබැල්ල.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. ආර්. සී. ප්‍රඥාරත්න විසින් 2013 ඔක්තෝබර් මස 22 වැනි දින සහතික කරන ලද අංක 415, 2013 නොවැම්බර් මස 21 වැනි දින සහතික කරන ලද අංක 418, 2018 දෙසැම්බර් මස 28 වැනි දින සහතික කරන ලද අංක 719 සහ 720 දරන ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දා වූ බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල ගෙවීමට D P Jayasinghe Piling Company (Private Limited සහ D P Jayasinghe Tours and Transport Company (Private) Limited ණයකරුවන් වශයෙන් පැහැර හැර ඇති බැවින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත සඳහන් දේපළ,

**2024 ක් වූ අප්‍රේල් මස 03 වැනි දින ප.ව. 2.30ට,**

මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*වැඩිදුර විස්තර සඳහා -* 2023.12.29 වැනි දින ශ්‍රී ලංකාණ්ඩුවේ *ගැසට්* පත්‍රයද, 2023.12.20 වැනි දින, ද අයිලන්ඩ්, දිවයින සහ තිනක්කුරල් යන පුවත්පත් බලන්න.

*දේපළට ප්‍රවිශ්ඨ වන මාර්ගය* - සිරිමාවෝ බණ්ඩාරනායක මාවත අසල තොටළඟ මංසන්දියේ සිට සේදවත්ත - අඹතලේ පාරේ මීටර් 140ක් පමණ ගමන් කිරීමෙන් පාරේ දකුණු පසින් අදාළ දේපළ පිහිටා ඇත.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවේලේ ම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතු යි :-

1. ගැණුම් මිලෙන් 10%ක් ද,
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ද,
3. වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2%ක්,
4. සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 1,500/-ක්ද,
6. වෙන්දේසි කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශයෙන් රු. 2000.00 ද වේ. ගැණුම් මිලේ ඉතිරි 90%ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතුයි.

*වැඩිදුර විස්තර සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා* - කොළඹ 02, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවතේ අංක. 73, දරන ස්ථානයේ පිහිටි ඩීඑෆ්සීසී බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු පුනරුත්තාපන සහ ණය අයකිරීම් ගෙන් විමසන්න. දුරකථන අංක : 011 2371371 විමසන්න.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්,
තක්සේරුකරු සහ වරලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන : 011 2873656,
ජංගම : 0777-672082
ෆැක්ස් : 011 2871184

03 - 305

**ඩීඑෆ්සීසී බැන්ක් පී.එල්.සී.**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

සේදවත්ත පාරේ, වරිපනම් අංක 222 දරන ස්ථානයේ තබා ගාල් කර ඇති අගනා යන්ත්‍රෝපකරණ සහ මෙවලම් :

| *(Description)* | *(Qty.)* |
|---|---|
| (Bauer BG 25 on BT 70 with accessories) | 02 |
| Service Crane | 02 |

සහ අමතර කොටස් උපාංග සහ උපකරණ ද, සේදවත්ත පාරේ, වරිපනම් අංක 222 දරන ස්ථානයේ දැනට තබා තිබෙන යම් අවස්ථාවක හා කලින් කළ ගබඩාකර හෝ තබා තිබිය හැකි වෙනත් යම් ගුදමක, ගබඩාවක හෝ පරිශ්‍රයක් තුළ හෝ මත දැනට තිබෙන වෙනත් සියලු චංචල පිරියත, යන්ත්‍රෝපකරණ, කලින් කළ හා සැමකල්හිම ගබඩාකර තබනු ලැබිය හැකි පරිශ්‍රයක තිබෙන සැම ආකාරයකම හා සියලු පිරියත යන්ත්‍ර උපකරණ සහ උපාංග සහ මින්මතු මේ බැඳුම්කරය බලාත්මකව පවතින කාලය ඇතුළත සහ සැම කල්හිම වරින්වර එකී පරිශ්‍රයට ගෙන එනු ලැබිය හැකි හෝ ඒ පරිශ්‍රයක තබා තිබිය යුතු හා තිබිය හැකි බන්ධනදායී විසින් මින් මතු යම් අවස්ථාවක සහ වරින් වර එම ගබඩාවට ගෙන යනු ලැබිය හැකි එකී චංචල පිරියත, යන්ත්‍රෝපකරණ අමතර කොටස් සහ උපාංග යනාදිය සමග වේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. ආර්. සී. ප්‍රඥාරත්න විසින් 2013 ඔක්තෝබර් මස 22 වැනි දින සහතික කරන ලද අංක 416 දරන ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දා වූ බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල ගෙවීමට D P Jayasinghe Piling Company (Praivate Limited සහ D P Jayasinghe Tours and Transport Company (Private) Limited ණයකරුවන් වශයෙන් පැහැර හැර ඇති බැවින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත සඳහන් දේපළ,

**2024 ක් වූ අප්‍රේල් මස 03 වැනි දින ප.ව. 2.45ට,**

මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*වැඩිදුර විස්තර සඳහා* - 2023.12.29 වැනි දින රජයේ *ගැසට්* පත්‍රයද, 2023.12.20 වැනි දින, ද අයිලන්ඩ්, දිවයින සහ තිනක්කුරල් යන පුවත්පත් බලන්න.

*යන්ත්‍රෝපකරණ තබා ඇති ස්ථානයට ප්‍රවිශ්ඨ වන මාර්ගය* - සිරිමාවෝ බණ්ඩාරනායක මාවත අසල තොටළඟ මංසන්දියේ සිට සේදවත්ත - අඹතලේ පාරේ මීටර් 140ක් පමණ ගමන් කිරීමෙන් පාරේ දකුණු පසින් අදාළ දේපළ පිහිටා ඇත.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවේලේ ම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතු යි :-

1. ගැණුම් මිලෙන් 10%ක් ද,
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ද,
3. වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2%ක්,
4. සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 1,500/-ක්ද,
6. වෙන්දේසි කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රු. 2000.00 ක් ද වේ. ගැණුම් මිළේ ඉතිරි 90%ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතුයි.

*වැඩිදුර විස්තර සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා* - කොළඹ 02, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවතේ අංක. 73, දරන ස්ථානයේ පිහිටි ඩීඑෆ්සීසී බැංකුවේ ජ්‍යෝෂ්ඨ කළමනාකරු පුනරුත්තාපන සහ ණය අයකිරීම් ගෙන් විමසන්න. දුරකථන අංක : 011 2371371 විමසන්න.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්,
තක්සේරුකරු සහ වරලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටෙ.
දුරකථන : 011 2873656,
ජංගම : 0777-672082
ෆැක්ස් : 011 2871184

03 -304

---

**පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී.එල්.සී.**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ **2024.04.30 වැනි දින පෙ.ව. 10.30** ට එකී දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, (මීගමුව ඉඩම් ලියාපදිංචි කොට්ඨාසය තුළ) මීගමුව මහ නගර සභා සීමාවේ සහ මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, අංක 73C, කුඩාපාඩුව දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ කුඩාපාඩුව ගමෙහි පිහිටි "කුඩාපාඩුව එස්ටේට්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එස්. ඒ. කොස්තා විසින් මැන සාදන ලද වර්ෂ 1996.10.28 වැනි දිනැති නමුත් වඩාත් නිවැරදි 1996 අංක 515 දරන පිඹුරෙහි දක්වෙන "ලොට් 12" දරන ඉඩම සහ එහි පිහිටි සියලු දෙය වේ. විශාලත්වය - පර්චස් 20.20

ෆ්‍රැන්ක් රත්නවිභූෂණ කරුණානායක යන අය "බන්ධනදායී/ උකස්කරු" වශයෙන් ලියාපදිංචි අංක පීකිව් 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට හලාවත ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එස්. එන්. තිසේරා විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2015.01.10 වැනි දිනැති අංක 1984 දරන ප්‍රාථමික උකස්කරය සහ වර්ෂ 2016.01.21 වැනි දිනැති අංක 2411 දරන ද්විතීයික උකස්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම සිදුකිරීම පැහැර හැර ඇති *හෙයින් ද*,

*යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා -* වර්ෂ 2024.02.02 වැනි දිනැති රජයේ *ගැසට් පත්‍රය*, වර්ෂ 2024.01.23 වැනි දිනැති දි අයිලන්ඩ්, තිනක්කුරල් පුවත්පත් සහ දිවයින පුවත්පත් ද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය* - පුත්තලම කොළඹ පාරේ මීගමුවේ පෙරියමුල්ල හන්දියෙන් ඇඩ්නිවස් පාරට හැරී මීටර් 600ක් පමණ දුරක් ගමන් කරන විට හමුවන පාලම පසුකර මීටර් කිහිපයක් ගමන් කළ පසු වම්පස පිහිටි තුෂාර මාවතට ගමන් කරන්න. ඉන් පසු "8 Plus Motels" ලෙස ප්‍රචලිත දකුණු පස ඇති විෂයගත දේපළ වෙත ළඟා වීමට මීටර් 30ක් පමණ මෙම මාර්ගය දිගේ ඉදිරියට යන්න.

*ගෙවීමේ ක්‍රමය.* -
වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු, එවේලේම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක් ද, (සියයට දහයක්)
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ද, (සියයට එකයි) සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2.5%ක් ද, (සියයට දෙකහමාරක්)
4. ප්‍රචාරක වියදම් ද,
5. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද,
6. ලිපිකරුගේ හා ඝෝෂකගේ ගාස්තුව සහ වෙන්දේසිය සඳහා වියදම් වූ අනෙකුත් ගාස්තු ද වේ.

වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතුය. එකී 90%ක ඉතිරි මුදල දින 30 ක් ඇතුළත දී නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාළ තොරතුරු ලබා ගැනීම සඳහා කළමනාකරු - ණය අයකර ගැනීම්, පෑන් ඒෂියා බෑංකින් කෝපරේෂන් පී.එල්.සී. ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර කොළඹ 03.

දුරකථන අංක : 011 4667227, 011 4667220 අමතන්න.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්,
තක්සේරුකරු සහ බලයලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දෙගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංකः 011 2873656, 0777672082

03 - 301

---

**පෑන් ඒෂියා බෑංකින් කෝපරේෂන් පී.එල්.සී.**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

පෑන් ඒෂියා බෑංකින් කෝපරේෂන් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දක්වෙන දේපළ,

**වර්ෂ 2024ක් වූ අප්‍රේල් මස 16 වැනි දින පෙරවරු 10.30ට,**

දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, කඩුවෙල ප්‍රාදේශීය සභා බල සීමාව තුළ වරිපනම් අංක 48, සුදර්ශන මාවත, මාළඹේ උතුර දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ මාළඹේ පිහිටි "මල්ගහවත්ත සහ කුඩලුදළුදෙහිග හවත්ත (වඩාත් නිවැරදිව මිල්ලගහවත්ත සහ කුඩලුදෙහිගහවත්ත)" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩබ්ලිව්. තෙපුලන්ගොඩ විසින් සාදන ලද 2007.08.25 වැනි දින දරන අංක 2792 දරන පිඹුරේ නිරූපිත ලොට් 03 දරන බෙදා වෙන්කළ ඉඩම සහ එහි පිහිටි සියලු දේ ද වේ. විශාලත්වය - පර්චස් 28.20

ලියාපදිංචි අංක පී.කිව්. 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පී.එල්.සී නමින්, ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් කේ. එච්. එම්. එම්. කේ. කාරියවසම් විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2021.03.30 වැනි දිනැති අංක 628 දරන උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම ඉන්ස්පිරන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය "බන්ධනදායී" සහ පුබුදු චන්දිමා විජේරත්න (බන්ධනදායී සමාගමේ අධ්‍යක්ෂ)

යන අය "උකස්කරු" ලෙස ද පැහැර හැර ඇති හෙයින් ද, *යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා* - වර්ෂ 2024.01.26 වැනි දිනැති *රජයේ ගැසට් පත්‍රය ද*, වර්ෂ 2024.01.22 වැනි දිනැති දිවයින, දි අයිලන්ඩ් පුවත්පත් සහ 2024.01.23 වැනි දිනැති තිනක්කුරල් පුවත්පත් ද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.* - මාළඹේ ප්‍රධාන හන්දියේ සිට නව මහනුවර පාර (බී263) ඔස්සේ කිලෝ මීටර් 1 1/2ක් කඩුවෙල දක්වා පැමිණ වමට ඇති සුදර්ශන මාවත ඔස්සේ මීටර් 850ක් පමණ T හන්දිය දක්වා ගමන් කර දකුණට ඇති එම මාර්ගය ඔස්සේම මීටර් 50ක් ගිය විට විෂය ගත දේපළ පාරේ වම් පසින් පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක් ද, (සියයට දහයක්)
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ද, (සියයට එකයි) සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් ගැණුම් මිලෙන් 2 .5%ක් ද, (සියයට දෙකහයි දශම පහක්)
4. විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද,
5. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද (රු. 5,000/-),
6. ලිපිකරුගේ සහ සෝෂකගේ ගාස්තු වශයෙන් රු. 2,500/- සහ මෙම විකිණීම සඳහාවන වෙනත් ඕනෑම ගාස්තු ද,

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතුය. නියම කොට හා ගිවිස ගෙන ඇති පරිදි එකී මුදල දින 30 ක් ඇතුළත දී නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ හිමිකම් ඔප්පු හා අනෙකුත් ලියකියවිලි පරීක්ෂා කිරීම සහ ලබා ගැනීම සඳහා කළමනාකරු - ණය අයකර ගැනීම් අංශය, පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී.එල්.සී., ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011 4667227/0114667130.

එන්. යූ. ජයසූරිය,
උසාවි කොමසාරිස් සහ
බලයලත් වෙන්දේසිකරු.

අංක 369/1,
දුටුගැමුණු මාවත,
මාවිල්මඩ,
මහනුවර.
දුරකථන : 077-3067360, 076-1375993, 071-8446374
ෆැක්ස් : 081-2210595

03 - 302/1

---

**පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී.එල්.සී.**

1990 අංක 4 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසියක්

පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී.එල්.සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන යන්ත්‍රෝපකරණ.

**වර්ෂ 2024.04.08 වැනි දින ප.ව. 2.30 ට**

යන්ත්‍රෝපකරණ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ (මොණරාගල ඉඩම් ලියාපදිංචි කොට්ඨාසය තුළ) මොරට්ටමුල්ල, නාගල, බිබිල යන ස්ථානයේ සවි කර ඇති M/S Inspirante (Pvt) Ltd ආයතනයේ කොම්පෝස්ට් ව්‍යාපෘතියට අයිති, පහත විස්තර කර ඇති උපකරණ ඇතුළුව ණයකරුට අයත් සියලු එක් එක් යන්ත්‍රෝපකරණ චංචල දේපළ සහ අනෙකුත් සියලුම චංචල දේපළ එකිනෙක පිළිබඳ විස්තර මින් මතුවට ණයකරු විසින් ඉහත කී දිස්ත්‍රික්කයේ, දැනට හෝ ඕනෑම අවස්ථාවක ගබඩාකර ඇති හෝ දේපළවල තමාගේ ව්‍යාපාරය පවත්වාගෙන යාමට හැකි ණයකරුගේ ඉහත කී සියලු යන්ත්‍රෝපකරණ, දේපළ, භාණ්ඩ සහ අනිකුත් චංචල දේපළවල විස්තර මෙම ක්‍රියාවලියේ දී එවකට හෝ විටින් විට ව්‍යාජ ලෙස ඉදිරිපත් කිරීමට හැකියාවක් ඇති හෙයින් ඒවා විටින් විට සටහන් කර තබන අතර ඉහත කී දේපළ සියල්ල හෝ එහි කොටසක් හෝ එහි ණයකරු විසින් පහත යනත්‍රෝපකරණ ඇතුළුව සියලු චංචල දේපළ සමග ඔහුගේ ව්‍යාපාරය කරගෙන යා හැකි අතර ඕනෑම අවස්ථාවක හෝ වරින් වර ගබඩා කර ඇති යන්ත්‍රෝපකරණ වේ.

| *ප්‍රමාණය* | *අයිතමය* | *ආකෘතිය* | *ආකෘති අංක* |
|---|---|---|---|
| 01 | Crawler Type Compost Turner : | - | SXLDF - 2400 |
| 01 | Loader type feeder : | - | SXCWL - 1823 |
| 01 | Belt Conveyor | - | - |
| 01 | Semi- wet Material Crusher : | - | SXSF- 40 |
| 01 | Belt Conveyor | - | - |
| 01 | Disc Granulator | - | SXYZ - 2500 |
| 01 | Belt Conveyor | - | - |

| ප්‍රමාණය | අයිතමය | ආකෘතිය | ආකෘති අංක |
|---|---|---|---|
| 01 | Rotary Screening Machine | - | SXGS- 1020 |
| 01 | Rotary Screening Machine | - | SXGS- 1020 |
| 01 | Horizontal Mixer | - | SXWJ- 7015 |

ඉහත 2 වන උපලේඛනයේ සඳහන් යන්ත්‍රෝපකරණ මෙහි පහත වඩාත් හොඳින් විස්තර කර ඇති ඉඩමේ පිහිටා ඇති පරිශ්‍රයේ පොළොවට සවිකර ඇත.

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, වේගම් පත්තුවේ, බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, බිබිල ප්‍රාදේශීය සභා බල සීමාව තුළ මොරට්ටමුල්ල දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ කීනගොම්මන ගමෙහි පිහිටි ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. එම්. එස්. බණ්ඩාර විසින් සාදන ලද 2020.09.06 වැනි දින දරන අංක MO-4182 දරන පිඹුරේ නිරූපිත ලොට් 2 යනුවෙන් ලකුණු කර ඇති බෙදා වෙන් කළ ඉඩම සහ ඒ මත පිහිටි ගහකොළ, වැවිලි, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේත් ය.

ලියාපදිංචි අංක පී.කිව්. 48 දරන පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී.එල්.සී. නමින්, ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් පී. ඒ. එස්. එස්. විජේරත්න විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2022.01.04 වැනි දිනැති අංක 58 දරන උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම ඉන්ස්පිරන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය "බන්ධදායී/උකස්කරු" ලෙස පැහැර හැර ඇති හෙයින් ද,

*යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා* - වර්ෂ 2024.01.26 වැනි දිනැති *රජයේ ගැසට් පත්‍රය ද*, වර්ෂ 2024.01.22 වැනි දිනැති දිවයින, දි අයිලන්ඩ් පුවත්පත් සහ 2024.01.23 වැනි දිනැති තිනක්කුරල් පුවත්පත් ද බලන්න.

*ඉහත කී දේපළට පිවිසෙන මාර්ගය.* - බිබිල මොණරාගල හන්දියේ සිට කිලෝ මීටර් 4.8ක් ඉගිනියාගල පාර ඔස්සේ බෝක්කු අංක 5/4 දක්වා ගොස් එම පාර දිගේ මීටර් 50ක් පමණ ගොස් දකුණට හැරී කොන්ක්‍රීට් පාර දිගේ කිලෝ මීටර් 1.2ක් පමණ ගොස් වමට හැරී මීටර් 100ක් පමණ බොරළු පාර දිගේ ගියවිට විෂයගත දේපළට ලඟා විය හැක.

*ගෙවීමේ ක්‍රමය.* - පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක් ද, (සියයට දහයක්)
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ද, (සියයට එකයි) සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 .5%ක් ද, (සියයට දෙකහයි දශම පහක්)
4. විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද,
5. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද (රු. 5,000/-),
6. ලිපිකරුගේ සහ සෝෂකගේ ගාස්තු වශයෙන් රු. 2,500/- සහ මෙම විකිණීම සඳහාවන වෙනත් ඕනෑම ගාස්තු ද,

වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතුය. නියම කොට හා ගිවිසගෙන ඇති පරිදි එකී මුදල දින 30 ක් ඇතුළතදී නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ හිමිකම් ඔප්පු හා අනෙකුත් ලියකියවිලි පරීක්ෂා කිරීම සහ ලබා ගැනීම සඳහා කළමනාකරු - ණය අයකර ගැනීම් අංශය පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී.එල්.සී. ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011 4667227/0114667130.

එන්. යූ. ජයසූරිය,
උසාවි කොමසාරිස් සහ
බලයලත් වෙන්දේසිකරු.

අංක 369/1,
දුටුගැමුණු මාවත,
මාවිල්මඩ,
මහනුවර.
දුරකථන : 0743067360, 076-1375993, 071-8446374
ෆැක්ස් : 081 - 2210595

03 - 302/2

---

**පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී.එල්.සී.**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසියක්

පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී.එල්.සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ

**වර්ෂ 2024.04.06 වැනි දින පෙ.ව. 10.30 ට,**

පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, (මීගමුව ඉඩම් ලියාපදිංචි කොට්ඨාසයේ) ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, කටුනායක සීදූව නගර සභාවේ සහ කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මුකලන්ගමුව බස්නාහිර, අංක 145බී, ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ මුකලන්ගමුව පිහිටි "පිස්කල්වත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඩී. ජී. වීරසිංහ විසින් මැන සාදන ලද වර්ෂ 2003.03.17 වැනි දිනැති අංක 2380 දරන පිඹුරෙහි (2015.03.24 වැනි දින නැවත මැනීමකට පසු එකී ඉඩමේ ප්‍රමාණය සහ මායිම් නොවෙනස්ව පවතින බවට එකී මිනින්දෝරුවා විසින් කරන ලද සහතික කර ඇත) (බලයලත් මිනින්දෝරු කේ. ඩී. ජී. වීරසිංහ විසින් මැන සාදන ලද 2002.10.18 දිනැති අංක 2311 දරන පිඹුරේ ලොට් 1 හි දැක්වෙන ඉඩම නැවත මැනීමක් සහ අනුබෙදීමකි) දැක්වෙන "ලොට් 105" දරන ඉඩම සහ එහි පිහිටි සියලු දේ ද වේ. විශාලත්වය පර්චස් 14.71

ලියාපදිංචි අංක පීකිව් 48 දරන පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී.එල්.සී. නමින්, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඩී. ජේ. එස්. මායාදුන්න විසින් සහතික කරන ලද වර්ෂ 2016.07.28 වැනි දිනැති අංක 1123 දරන උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම චන්දන ආරියප්පෙරුම යන අය "බන්ධදායී/උකස්කරු" වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද,

*යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා* - වර්ෂ 2023.03.03 වැනි දිනැති *රජයේ ගැසට් පත්‍රය ද*, සහ වර්ෂ 2023.02.24 වැනි දිනැති දිවයින, දි අයිලන්ඩ් සහ තිනක්කුරල් පුවත්පත් ද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.* - කොළඹ සිට මීගමුව පාරේ කිලෝමීටර් 21.5ක් පමණ ඉදිරියට යන විට කොටුගොඩ පාර හමුවේ. එතැන් සිට මීටර් 800ක් ඉදිරියට ගොස් දකුණට ඇති ඊරියගහළිඳ පාරට හැරී නැත මීටර් 500 පමණ ගොස් දකුණට හැරී 2 වන පටුමග හමුවේ. එම පටුමග ඔස්සේ මීටර් 125ක් යනවිට විෂයගත දේපළ වම්පසින් පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක් ද, (සියයට දහයක්)
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ද, (සියයට එකයි) සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 .5%ක් ද, (සියයට දෙකහයි දශම පහක්)
4. විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද,
5. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද (රු. 5,000/-),
6. ලිපිකරුගේ සහ සෝෂකගේ ගාස්තු වශයෙන් රු. 2,500/- සහ මෙම විකිණීම සඳහාවන වෙනත් ඕනෑම ගාස්තු ද,

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂයවන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතුය. නියම කොට හා ගිවිසගෙන ඇති පරිදි එකී මුදල දින 30 ක් ඇතුළතදී නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ ලබා ගැනීම සඳහා කළමනාකරු - ණය අයකර ගැනීම්, පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී.එල්.සී. ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011 4667227/0114667220.

එල්. බී. සේනානායක,
බලයලත් වෙන්දේසිකරු සහ උසාවි කොමසාරිස්,
තක්සේරුකරු, කොළඹ වාණිජ මහාධිකරණ සහ
දිසා අධිකරණය.

බලයලත් වෙන්දේසිකරු රාජ්‍ය සහ වාණිජ බැංකු,
අංක 7/1/10,
1 වන මහල,
සුපර් මාර්කට් කම්ප්ලෙක්ස්,
බොරැල්ල,
කොළඹ 08.
දුරකථන : 0112396520

03 - 345

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. - මහනුවර ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී. කිව්. 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර ගඟවට කෝරළේ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ මහනුවර මහ නගර සභා සීමාවන් තුළ, අංක 251, සෙංකඩගල ග්‍රාම නිලධාරී වසමහි ශ්‍රීමත් බෙනට් සොයිසා වීදිය (කොළඹ වීදිය) පිහිටි බලයලත් මානක ජේ. ආර්. ඒ. ඩී. ජේ. සෙනවිරත්න විසින් 2012 ජූලි මස 14 වැනි දින මැන සාදන ලද අංක 1504 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කළ ලොට් 01 දරන ඉඩම් කොටස.

ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම හයක් (පර්.7.6) වරිපනම් අංක 233 දරන තුන් මහල් ගොඩනැගිල්ල, ගහකොළ, වගාව ඇතුළු අනෙකුත් සියලු දේ.

මහනුවර කොළඹ වීදිය, අංක 233 දරන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පිහිටි ඩබ්ලිව්. ඩී. ආර්. සමරකෝන් ඇන්ඩ් සන්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් බන්ධනදායී වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස් කරන ලද ඉහත උපලේඛනයේ සඳහන් දේපළ.

**වර්ෂ 2024 ක් වූ අප්‍රේල් මස 05 වැනි දින පෙ.ව. 11.30ට,**

ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*යෝජනා සම්මුතිය සඳහා* : 2019.10.04 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2019.10.29 වැනි දින මව්බිම, ද අයිලන්ඩ් සහ තිනක්කුරල් පුවත්පත් ද බලන්න. තවද, නව වෙන්දේසිකරුවෙකු පත් කිරීමේ නිවේදනයට අදාළ යෝජනා සම්මුතිය සඳහා 2023.04.21 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* ද, 2023.05.15 වැනි දින දිවයින සහ ද අයිලන්ඩ් පුවත්පත් ද බලන්න.

*දේපළ වෙත පිවිසීම* - මහනුවර නගරයේ සිට යටිනුවර වීදිය ඔස්සේ සර් බෙනට් සොයිසා වීදිය මංසන්ධිය දක්වා මීටර් 70ක් පමණ ගමන් කර බෙනට් සොයිසා වීදිය ඔස්සේ වමට හැරී තවත් මීටර් 100ක් ගමන් කළ විට විෂයගත දේපළ වෙත ළඟා විය හැක.

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
(02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
(03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
(04) ලිපිකරු හා සෝෂක වේතනය රු. 2,000,
(05) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්,
(06) ගැණුම්කරු විසින් එකතු කල වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතුයි.
(07) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ මහනුවර ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී,
අංක 120,
කොටුගොඩැල්ල වීදිය,
මහනුවර.
දුරකතන අංකය : 081 2223163
ෆැක්ස් අංකය : 081 2201711

ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ,
තක්සේරුකරුවෝ සහ උසාවි කොමසාරිස්වරු.

අංක 1/7/10,
1 වන මහල,
සුපර් මාර්කට් කම්ප්ලෙක්ස්,
කොළඹ 08.
දුරකථන : 0112396520
ඊමේල් : senaservice84@gmail.com

03 - 314

---

## කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ්

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීම

එනම් ග්ලැඩ්වින් ඇන්තනී ඩෙන්සිල් ලුඩ්වික් උකස්කරු සහ/හෝ බන්දනදායි වශයෙන් සහ ඉනේෂා කෞමදි ලුඩ්වික් බන්ධනදායි වශයෙන් කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ් (ලියාපදිංචි අංක; PB4847 දරන) නමට ප්‍රසිද්ධ නොතාරිස් ඒ. සී. නදීශා විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2018.08.06 දිනැති අංක. 433, 435 සහ 438 දරන උකස් බැඳුම්කර මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්;

කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ් විසින් මා වෙත පවරන ලද බලතල අනුව පහත සඳහන් දේපළ,

**2024 අප්‍රේල් මස 08 වැනි දින පෙ. ව. 9.00 ට,**

එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ

දෙහිවල ගල්කිස්ස මහනගර සභා සීමාව තුළ දුටුගැමුණු පාරේ, 537A දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ කළුබෝවිල පල්ලිය පාරේ, පිහිටි වරිපනම් අංක 15 (කොටස) වන "මීගහවත්ත සහ එරකඩේ වත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් මැන සාදන ලද අංක 3495/9000 සහ 2005 ජූලි 27 දින දරන පිඹුර ප්‍රකාර ප්‍රමාණයෙන් පර්චස් විසිහතරයි දශම හතයි බින්දුවක් (පර්. 24.70) වන ඉඩම් කොටස සහ ඊට අයත් ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ සියලුම දේ වන අතර මෙම ඉඩම දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම්/පත්‍රිරු අංක F 227/89 හි ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් ඉඩම්වල මාර්ග අයිතීන් ද සමග වේ.

